# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය - සිව්වන වසර - 2018

## කම්කරු නීතිය

**පැ තුනයි (03)**

**මුළු ප්‍රශ්න සංඛ්‍යාව - 07**

ප්‍රශ්න <u>හතරකට (04)</u> පමණක් පිළිතුරු සපයන්න.
**(අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කෙරේ.)**

---

01. සංඛ්‍යාත්මක ලෙස වර්ධනය වන විවිධාකාර නිදහස් ගිවිසුම්කරුවන්ගෙන් පෙනී යන්නේ සමාජ ආරක්ෂණ ව්‍යවස්ථාවන් හි පවතින බොහොමයක් විධිවිධාන වල අදාළත්වය වැඩ පිළිබඳ ලෝකය (world of work) තුළින් ඉවත්ව යන බවයි.

    (අ) උක්ත ප්‍රකාශයෙන් හැඟවෙන අර්ථය ඔබගේ වචනයෙන් පැහැදිලි කරන්න.

    (ආ) මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ ද? මතුවෙමින් පවතින විවිධාකාර රැකියා වර්ග සහ ශ්‍රී ලංකාවේ රැකියා සබඳතාවට අදාළව පැනවී ඇති සමාජ ආරක්ෂණ නීති ව්‍යුහය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඔබගේ පිළිතුර සනාථ කරන්න.

02. දිවයින පුරා විහිදෙන ශාඛා ජාලයක් සහිතව මැනවින් ස්ථාපිත ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන සී/ස නීරෝගා හොස්පිටල්ස් සමාගම වෛද්‍ය මෙන්ම පරිපාලන නිලධාරීන් ද ඇතුළත් පාලක මණ්ඩලයක් යටතේ ක්‍රියාත්මක වේ. රෝහලට අදාළ නේවාසික හෝ උපදේශක, පූර්ණ කාලීන හෝ අර්ධකාලීන වෛද්‍ය කාර්ය මණ්ඩලය ඇතුළු රෝහලට අවශ්‍ය අනෙකුත් සියලුම පත්වීම් රෝහලේ පාලක මණ්ඩලයෙන් සිදු කෙරේ. දුරකථන ඇමතුමක් මාර්ගයෙන් ශෛල්‍ය වෛද්‍යවරයා විසින් ඉල්ලුම් කළ ඖෂධ නාමයකට අදාළ උපදෙස්වලට වැරදි ලෙස සවන්දීම හේතු කොට ගෙන (ප්‍රොකේන් ඖෂධය වෙනුවට කොකේන් ඖෂධය) රෝහලේ ඔසු සලේ සේවය නිරතව සිටි නේවාසික වෛද්‍ය නිලධාරියා විසින් යැවූ මාරක ඖෂධය ශල්‍ය වෛද්‍යවරයා විසින් රෝගියාට එන්නත් කිරීමෙන් පසුව රෝගියා ජීවිතක්ෂයට පත්විය.

අ.පි.බ.

මෙම අවස්ථාවේදී සීමාවාසික පුහුණුව ලබමින් සිටි වෛද්‍ය සිසුන් දෙදෙනෙක් ශල්‍ය වෛද්‍යවරයාට සහාය වී ඇත.

(අ) රැකියා ක්ෂේත්‍රය තුළදී සී/ස නිරෝගා හොස්පිට්ල්ස් සමාගමට පැවරෙන වගකීම පහත දැක්වෙන අවස්ථා ඇසුරෙන් සාකච්ඡා කරන්න:

(i) රෝහලේ ඔසුසලේ සේවයේ නිරතව සිටි නේවාසික වෛද්‍යවරයා;

(ii) ඖෂධය එන්නත් කළ ශල්‍ය වෛද්‍යවරයා:

(iii) අදාළ අවස්ථාවේදී ශල්‍ය වෛද්‍යවරයාට සහය වූ සීමාවාසික පුහුණුව ලබමින් සිටි වෛද්‍ය සිසුන් දෙදෙනා;

රැකියා නීතිය පිළිබඳ ක්ෂේත්‍රයේදී සේවායෝජකයෙක් සතු වගකීම තීරණය කිරීම පිණිස අධිකරණය විසින් සැලකිල්ලට ගැනෙන නිර්ණායකයන් කෙරෙහි ඔබගේ දැඩි අවධානය යොමුවිය යුතු ය.

(ආ) ශල්‍ය කර්මය සිදුකළ වෛද්‍යවරයා ස්වේච්ඡා පදනමින් එම රෝහලට සේවය සැපයූ බාහිර විශේෂඥ වෛද්‍ය උපදේශකයකු (visiting consultant) මෙන්ම ස්වකීය සේවය අනෙකුත් රෝහල්වලටද සැපයීමේ නිදහස හිමි වෛද්‍යවරයකු වී නම් ඔබගේ පිළිතුර වෙනස් වේදැයි පැහැදිලි කරන්න.

03. සී/ස ගයාත්‍රී ගාමන්ට්ස් සමාගමට අයත් නුවර පිහිටි කර්මාන්තශාලාවේ කාන්තා සේවිකාවන් 350 දෙනෙක් සහ එහි වැඩ අධීක්ෂක වශයෙන් සැක්සන්ද සේවයේ නිරත කර තිබේ. තමන්ගේ අභපසහ පිළිබඳව ලිංගික හැඟීම් උපදනවන සුළු විහිළු තහළු කළ බවට සැක්සන්ට එරෙහිව චෝදනා කරමින් කර්මාන්තශාලාවේ කාන්තා සේවිකාවන් තිදෙනෙක් විසින් යොමු කළ ලිපියක් කළමනාකාරිත්වයට ලැබුන අතර විෂමාචාරය මත සමාගම, සැක්සන්ගේ රැකියාව අවසන් කළේය. සැක්සන් වසර 15 ක් සමාගමට සේවය කරමින් එහි ව්‍යාපාරික ගනුදෙනු ප්‍රවර්ධනයට දායක වී ඇති බවත් එම කාලසීමාව තුළදී වෙනත් කිසිදු විෂමාචාරයකට ඔහුට එරෙහිව චෝදනා එල්ල වී නැති බවත් සමාගමේ මානව සම්පත් කළමනාකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියි.

කම්කරු විනිශ්චය සභාවට ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරන සැක්සන් ලිංගික හැඟීම් උපදනවන සුළු විකට ප්‍රකාශ කළ බව පිළිගත් අතර සේවිකාවන් තිදෙනා කොට සාය ඇඳ සිටි බව දුටු පසුව එකී ලිංගිකත්වයට බර ප්‍රකාශ සිදුකළ බව සැක්සන් විනිශ්චය සභාවේ විමර්ශනයේ දී වැඩිදුරටත් කියා සිටියේය. තවද තමාට එල්ල වී ඇති විෂමාචාරය චෝදනාව බරපතල එකක් නොවන බවත් පුරුද්දක් වශයෙන් තමා විසින්

අ.පි.බ.

එබඳු කවටකම් සිදු නොකල බැවින් රැකියාව අවසන් කිරීම අසාධාරණ බව කියා සිටියි. රැකියා අවසන් කිරීම යුක්තිසහගත යැයි තීන්දු කළ ද සාධාරණ සහ යුක්තිසහගත පදනම මත වන්දියක් ලබා ගැනීමට හිමිකමක් තමාට ඇති බව හෙතෙම වැඩි දුරටත් ප්‍රකාශ කර සිටියි.

සැක්සන් විසින් යොමු කළ ඉල්ලුම් පත්‍රය විමර්ශනය කරනු ලබන කම්කරු විනිශ්චය සභාවේ සභාපතිවරයා ඔබ වේ නම් ඔබ විසින් නිකුත් කරනු ලබන නියෝගය කුමක්ද?

04. බස්නාහිර සහ දකුණු පලාත්වල පිහිටුවන ලද ශාඛාවන් සහිත සී/ස ABC සහ සමාගම 2010-01-01 දාතමින් යුතුව නිකුත් කළ ලිපිය මගින් X නැමැත්තා එහි කළමනාකාර අධ්‍යක්ෂ ධූරයට පත් කළේය. 2012-01-01 දින නිකුත් කළ ලිපියක් මගින් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් X පත්කළ අතර ඒ සඳහා විධිමත් රැකියා ගිවිසුමකට එළැඹෙන ලෙසට ඉල්ලා සිටියේය. එම ධූරය වෙනුවෙන් නිකුත් කළ පත් වීමේ ලිපියේ අඩංගු වූ නියමයන් සහ කොන්දේසි අතර X ගේ මාසික වැටුප රු.250,000/= බවත් එම රැකියාව භාර ගැනීම නිසා ඔහුට අහිමි වන විශ්‍රාම වැටුප වෙනුවට මාසික දීමනාවක් ගෙවීමට එකඟ වූ ප්‍රතිපාදනයක් ද එහි ඇතුළත් කර තිබේ. X එම ධූරයෙන් 2016-12-30 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වූ අතර තමාට හිමිවිය යුතු පාරිතෝෂිත දීමනාව පිළිබඳව හෙතෙම සමාගමෙන් විමසීමක් සිදු කළේය. ක්‍රියාකාරි අධ්‍යක්ෂවරයා වශයෙන් කටයුතු කළ බැවින් X විශේෂ ප්‍රභේදයකට අයත් සේවකයෙක් බවත් පවතින නීතිය යටතේ X ට පාරිතෝෂික දීමනාවක් ගෙවීම පිණිස සමාගමට වගකීමක් පැවරී නොමැති බව කියා සිටියි.

අනතුරුව X විසින් රැකියා සමාප්තියකදී ඔහුට හිමි දීමනාව ලබා ගැනීම සඳහා නියෝගයක් නිකුත් කරවා ගැනීමේ අදහසින් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉල්ලුම් පත්‍රයක් යොමු කරයි.

(අ) X විසින් ඉදිරිපත් කළ එම ඉල්ලුම් පත්‍රය විභාග කරනු ලබන කම්කරු කොමසාරිස් ජනරාල්වරයා ඔබ නම් ;

(i) මෙම අවස්ථාවේදී ඔබ විසින් අදාළ කරගත යුතු කාර්යපටිපාටිය පැහැදිලි කරන්න.

(ii) X විසින් ඉල්ලා සිටින රැකියා සමාප්තියකදී ලබා දිය යුතු ප්‍රතිලාභය සඳහා X ට හිමිකමක් තිබේද?

(iii) එසේ නම් X ට අදාළ වන නෛතික ප්‍රතිපාදන පැහැදිලි කරන්න.

අ.පි.බ.

(iv) එම ප්‍රතිලාභය ගණනය කරනු ලබන ක්‍රමවේදය පැහැදිලි කොට එකී ප්‍රතිපාදනවලට අනුව x ට ලැබිය යුතු පාරිතෝෂික දීමනාවේ ප්‍රමාණය සඳහන් කරන්න.

(ආ) අනුමැතියකින් තොරව පෞද්ගලික දුරකථන ඇමතුම් විදේශ රටවලට ලබාගැනීම නිසා රු.200,000/= අලාභයක් x විසින් තමන් හට සිදු කර ඇති බව සමාගම වැඩි දුරටත් කියා සිටියි. ඉදිරිපත් කර තිබෙන ඉල්ලුම්පත්‍ර සලකා බලා ඔබ විසින් නිකුත් කළ යුතු නියෝගය සඳහා උක්ත ප්‍රකාශයේ සඳහන් චෝදනාවේ අදාළත්වයක් පවතින්නේ දැයි පැහැදිලි කරන්න.

5. පහත දැක්වෙන අවස්ථා සඳහා නෛතික උපදේශ ලියා දක්වන්න:

(අ) ශ්‍රී ලංකාවේ කාර්මික සාමය පවත්වා ගැනීමේ යාන්ත්‍රණයක් ලෙස කාර්මික බේරුම්කරණයේ ඵලදායිතාව;

(ආ) ශ්‍රී ලංකාවේ රැකියා ක්ෂේත්‍රය තුළ වෙනස් කොට නොසැලකීම ප්‍රවර්ධනය කිරීම (to promote non-discrimination in employment) වෙනුවෙන් දක්වන ප්‍රතිචාර වල ඵලදායිතාවය.

6. ජාතික මානව සම්පත් කළමනාකරණ සමුළුවකදී, සේවායෝජකයන්ගේ සංවිධානයක් නියෝජනය කල කථිකයෙක් මෙසේ ප්‍රකාශ කර ඇත.

"ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යවස්ථා තුළ වෘත්තීය සමිති ක්‍රියාකාරීන් සහ වෘත්තීය සමිති වෙනුවෙන් අසාධාරණ ලෙස පක්ෂග්‍රාහී වන විධිවිධාන පවතී. මේ නිසා ශ්‍රී ලංකාවේ ආයෝජන ප්‍රවර්ධනයට බලපෑමක් සිදු වේ."

ජාත්‍යන්තර ප්‍රකාශනවල අඩංගු සිද්ධාන්ත සහ ශ්‍රී ලංකාවේ කම්කරු නීතිවල අඩංගු විධිවිධාන වෙත අවධානය යොමු කරමින් උක්ත ප්‍රකාශයෙන් පිළිබිඹු වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

අ.පි.බ.

07. ධීවර ආම්පන්න නිෂ්පාදනය උදෙසා විදේශීය අනුග්‍රාහකයකුගේ සහයෝගිත්වයෙන් සී/ස ටූනා-ෂියර් සමාගම ආරම්භ කළ අතර නිෂ්පාදන ක්‍රියාවලියට අවශ්‍ය මූල ද්‍රව්‍ය සැපයීමට මෙන්ම නිමි භාණ්ඩ මිල දී ගැනීමටත් එකඟ විය. වසර කීපයක් ව්‍යාපාරික කටයුතු වල නියැලීමෙන් පසුව විදේශීය අනුග්‍රාහක විසින් එළැඹී තිබූ සහයෝගිතා ගිවිසුම කඩකළ බැවින් ව්‍යාපාරික ගනුදෙනුවලට එල්ල වූ බලපෑම් නිසා නිෂ්පාදන ක්‍රියාවලිය ද ඇනහිටියේය. සමාගම එහි සේවය කළ ස්ථිර සහ ස්ථාපනය වූ සේවකයින් 18 දෙනෙකුට අඛණ්ඩව වැටුප් ගෙවූ නමුත් නව ව්‍යාපාරික අනුග්‍රාහකයෙක් සම්බන්ධ කර ගන්නා තුරු සේවයට වාර්තා කිරීමෙන් වැළකී සිටින ලෙසට උපදෙස් දුන්නේය. නැවත නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කළ පසුව පෙර සිටි සේවකයන් යළි සේවයේ යොදවන බවට පොරොන්දු වෙමින් මෑතකදී සමාගමේ පාලක මණ්ඩලය විසින් ආයතනය තාවකාලිකව වසා දැමීමට තීන්දු කළේය. පාලක මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයේ වලංගුතාව ඇසුරෙන් සී/ස ටූනා-ෂියර් සමාගම නීති උපදෙස් පතයි.

(i) අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සමාගමට උපදෙස් දෙන්න.

(ii) දැනටමත් සමාගම පූර්ණලෙස වසා දමා ඇත්නම් ඔබගේ උපදෙස් වෙනස් වන්නේදැයි පැහැදිලි කරන්න.

(iii) සමාගම පිහිටුවීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය සම්පූර්ණයෙන් රජය මගින් සපයා දී තිබුනේ නම් ඔබගේ පිළිතුර වෙනස් වේදැයි පෙන්වා දෙන්න.

○o○o○o○o○o○o○o○o